# රබර් ඉඩම්වල තෘණ වගාව

එල්. එස්. එස්. පතිරත්න

ශ්‍රී ලංකාවේ රබර් වගාකිරීම සඳහා භාවිතා කොට ඇති බිම් ප්‍රමාණය ගැන සලකා බැලීමේදී ආදායම් නොලබන, අපරිනත අවධියේ රබර් සඳහා වෙන්ව ඇති ඉඩම් ප්‍රමාණය අති විශාලය, සාමාන්‍යයෙන් සෑම වසරකම හෙක්ටයාර් 30,000ක පමණ නැවත රබර් වගාකරන අතර, මෙම බිම් ප්‍රමාණයෙහි ප්‍රයෝජනවත් ලෙස අතුරු බෝග වගා කිරීම ඉතා ඵලදායී වනු ඇත. වගා කටයුතු සඳහා ඉතිරිව ඇති බිම් ප්‍රමාණය සීමා වෙමින් පවතින මෙම අවධියේ ඉහත සඳහන් බිම් ප්‍රයෝජනවත් ලෙස වගා කිරීමෙන් රැකියා ප්‍රශ්ණ විසඳීම කෙරෙහිද රුකුලක් ලැබිය හැකිය.

විවිධ අතුරු බෝග, රබර් සමග වගාකරන අතර, තෘණ වගාවද අපරිනත රබර් වගාවන් සමග පවත්වාගෙන යාහැකි තවත් වැදගත් වගාවකි. තවද, සුදුමුල් රෝගයට පාත්‍රවීම නිසා හිස්ව ඇති බිම්ද මෙම තෘණ වගාවන් සඳහා යොදාගත හැකිය. සාමාන්‍යයෙන් ලංකාවේ රබර් ඉඩම් වලින් 8% ක් පමණ සුදුමුල් රෝගය නිසා හිස්ව පවතින බව මෙහිදී සැලකිල්ලට ගතයුතු ඉතා වැදගත් කරුනකි.

පොල් ඉඩම් වල ඉතා සාර්ථකව තෘණ වගාවන් පවත්වාගෙන යන අතර, පහත රට තෙත් කලාපයට අයිති රබර් වගා ප්‍රදේශවලද තෘණ වගාවට සුදුසු දේශගුණික තත්ත්වයන් පවතී. මෙම ප්‍රදේශයන්හි වසරකට මි. මී. 2500 ක පමණ මනා ලෙස අවුරුද්ද පුරා විසිරී ඇති වර්ෂාපතනයන් ඇති හෙයින් වසර පුරාම තෘණ නිෂ්පාදනය පහසු වේ.

එහෙත් අපගේ අත්දැකීම් වලට අනුව රබර් වගාවක මුල් අවුරුදු 4—5 කාලය පමණක් මේ සඳහා සාර්ථක ලෙස උපයෝගී කරගත හැකිය. තවද, ගවයින් මගින් රබර් පැල වලට හානි සිදුවීමට ඉඩ ඇති නිසාත්, ඔවුන් තෘණ උලා කෑම හා ඇවිදීම නිසා මතුපිට පස පාංශු ඛාදනයට ලක්වීමට ඉඩ ඇති නිසාත්, රබර් වගාව තුල ගවයින්ට නිදැල්ලේ උලා කෑමට ඉඩ හැරීම සුදුසු නොවේ. එහෙත් කපා ඉවත් කරගත් තෘණ, මඩු තුල ඇතිකරන ගවයින්ට සැපයීම මෙහිදී උපයෝගී කරගත හැකි ක්‍රමය වේ.

රබර් වගා කිරීමේදී අනුගමනය කරන විවිධ පරතරයන් තුල තෘණ වගාකල හැකි අතර, රබර් පේලි දෙක අතර වැඩි පරතරයක් ලබා දෙන '8X27' (2.4 X8.23 මීටර්) වැනි පරතරයන් තුල තෘණ වගාව වඩාත් පහසුවේ. තෘණ සහ ඒ සමග වවන රනිල වැල් වර්ගද, සෙ. මී. 50 ක පමණ දුරින් වූ පේලි වශයෙන් රබර් පේලි අතර සිටුවීමට හැකි අතර, එක් පේලියක පැල අතර දුර සෙ. මී. 25 වශයෙන් යොදා ගත හැකිය.

අත්හද බැලීම් වලට භාජනය කර ඇති තෘණ වර්ග අතර පැනිකම මැක්සිමම් (ගිනි ඒ සහ බී වර්ග (Panicum maxi—

mum var. Guinea A and B) බ්‍රැකේරියා බ්‍රිසැන්තා (Brachiaria brizantha) වඩාත් හොඳ අස්වැන්නක් ලබා දෙන අතර, පෙනිසිටම් පර්පියුරියම්—එන් බී 21 (Pennisetnm purpeurium NB21) පැස්පැලම් පිලිකැටුලුම් (Paspalum pilicatulm) බ්‍රැකේරියා රුසිසෙනෙන්සිස් (Brachiaria rhuziziensis) ආදියද හොඳ අස්වැන්නක් ලබා ගත හැකි වර්ග වේ. මෙම වර්ග වලින් සාමාන්‍යයෙන් දින 30—40 වරක් තෘණ කපා ඉවත් කර ගැනීම මගින් වසරකට හෙක්ටයාරයකින් කිලෝ ග්‍රෑම් 7000—12000ක් පමණ තෘණ නිෂ්පානයක් (වියලි බර) බලාපොරොත්තු විය හැකිය. තෘණ වගාව සමග මිශ්‍ර ලෙස පියුරේරියා (Puerarla) සෙන්ට්‍රොසීමා (Centrocema) ස්ටයිලෝසැන්තස් (Stylosanthus) වැනි රනිල වගා කිරීමෙන් වැඩි සත්ව ආහාර ප්‍රමාණයක් නිෂ්පාදනය කල හැකිවා මෙන්ම ඒවයේ පෝෂණ ගුණයද උසස් කල හැකිවේ.

මෙම රනිල වර්ග අතුරින් ස්ටයිලොසැන්ත්ස් වඩාත් වැඩි නිෂ්පාත—යක් ඇති වර්ගය වන අතර, බ්‍රැකේරියා වැනි තෘණ වර්ග සමග රනිල වැල් වල වැඩීම හා පැවැත්ම එතරම් සතුටුදායක නොවේ. තවද, තෘණ වර්ග මෙන් නොව රනිල වැල් වර්ග නිතර නිතර කපා ඉවත්කර ගැනීම් වලට ඔරොත්තු නො—දෙන හෙයින් වගාකොට වසර දෙකක් පමණ වන විට ඒවායේ වැඩීම දුර්වල වී යයි. රනිල වැල් වර්ග වල මෙම අඩුපාඩු මකාලීමට එක් පිලියමක් වශයෙන් තෘණ වගා සමග ග්ලිරිසීඩියා (Gliricidia) හා ඉපිල් ඉපිල් (Ipil Ipil) වැනි රනිල ගස් වර්ග වැවීම පරීක්ෂණ වලට භාජනය කිරීම දැන් අරඹා ඇත.

තෘණ වගාව නිසා රබර් ශාකයේ වැඩීමට බාධා ඇතිකරන අහිතකර බලපෑම් ගැනද අප විසින් සැලකිය යුතු වැදගත් කරුණකි. රබර් ශාකයේ මධ්‍යම අපරිනත කාලය වන මුල් අවු: 2-3 තුල මෙම බලපෑම වැඩි වන අතර. රබර් ගස මුල මීටර් 1.5–2.0 අරයකින්යුත් ප්‍රදේශයක් තෘණ තොරව පවත්වා ගෙන යාමෙන් ඉහත කී බලපෑම් අඩුකර ගතහැකි මගකි. කෙසේ වුවද, විවිධ තෘණ වර්ග වල නිෂ්පාදන ශක්තිය මත මෙම තරගකාරි බව රඳා නොපවතී. උදහරණයක් වශයන් නිෂ්පාදන ප්‍රමාණය අඩු බ්‍රැකේරියා බ්‍රිසැන්තා රබර් ගසට වඩාත් තරඟ කාරි වන අතර,, වැඩි නිශ්පාදන ශක්තියක් ඇති පැනිකම් වර්ගය රබර් ගසට දක්වන තරගකාරී බව අඩුය. මේ අනුව තරගකාරි බවෙන් අඩු තෘණ වර්ග තෝරා ගැනීම මෙහිදී සුදුසු බව පෙනී යයි. තෘණ/රනිල මිශ්‍ර වැවිල්ලකදී මෙම තරගකාරි බව සාමාන්‍යයෙන් අඩු බැව් අපගේ පරීක්ෂණ දත්තයන්ගෙන් පෙන්නුම් කරයි. උදහරණයක් වශයෙන් රනිල ආවරණ වැල් පමණක් රනිල/තෘණ, හා තෘණ පමණක් වගාකොට කල පරීක්ෂණ සැසඳීම් වලදී රනිල ආවරණය පමණක් තිබූ ස්ථානවල රබර් ගස් හොඳින් වැඩුන අතර, අඩුම වැඩීමක් පෙන්වූයේ තෘණ පමණක් වගාකල ස්ථාවලය. මේ අනුව පෙනී යන්නේ තෘණ සමග මිශ්‍ර ලෙස රනිල වර්ගයන් වැවීම වඩාත් සුදුසු බවයි.

ඉහත සඳහන් සියලු තෘණ වර්ග වසර 5ක් පමණ පවත්වාගෙන යාහැකි අතර, සාමාන්‍යයෙන් වසර $3\frac{1}{2}$ ක් පමණ ගතවීමෙන් පසු තෘණ නිෂ්පාදනය අඩුවී යන බව අපගේ අත්දැකීමයි. රබර් ගස්වල අතුපතර විහිදීමෙන් ඇතිවන සෙවන හා මුල් පැතිරීයාම නිසා ඇතිවන තරගකාරී බවද මෙයට හේතු වේ.

අතුරු බෝගයක් ලෙස තෘණ වගාකිරීමේදී අනෙක් අතුරු බෝග වැවීමේදී මෙන්ම රබර් ගස් වලට අමතරව තෘණ වගාවටද

නිසි ලෙස පොහොර යෙදීම සිදුකල යුතුයි.

තවදුරටත් පර්යේෂණ මගින් සනාථ කෙරෙන තුරු රබර් වගාවන් සමග තෘණ වගාකිරීම සම්බන්ධයෙන් මෙම ආයතනය මගින් දැනට නිර්දේශ—යන් ඉදිරිපත් කර නොමැත. තෘණ වගාවේ බලපෑම හේතුවෙන් රබර් ගස්වල වැඩීමේ වේගය අඩු වීම නිසා කිරි කැපීම ආරම්භ වීමට ගතවන කාලය අවුරුද්දකින් පමණ දිඝීවීම මෙහිදි බලපාන ප්‍රධාන ගැටලුවයි. නමුත් මාස 5ක් පමණ කෙටි කාලයකදී එලදාව ලබගත හැකි වගාවක් වශයෙනුත්, ගව ආහාර ලෙස විශාල තෘණ නිෂ්පාදනයක් ලබාගත හැකි නිසාත්, තෘණ වගාව ඉතාමත් එලදයි වගාවක් ලෙස සැලකීමට සිදුව ඇත. විශාල වශ—යෙන් ගව පට්ටි පාලනය ව්‍යාප්ත කිරීමේ හැකියාව මේ මගින් බිහිවන අතර, එය ආහාර නිෂ්පාදනය කිරීම අතින්ද ප්‍රධාන කාර්යයක් ඉටුකිරීමේ මාර්ගයක්ද වනු ඇත. මීට අමතරව රසායනික පොහොර මිල අධික මේ අවධියේ ඒසඳහා ඉතාමත් යෝග්‍ය විකල්පයක් ලෙස ගව පාලනය මගින් ලැබෙන අතුරු ඵලයක් වූ කාබනික පොහොර යොදගත හැකිවීමද තවත් විශාල ලාභයකි.